- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01-05 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.**



නූතන යුගයේ ප්‍රවීන චිත්‍ර ශිල්පියෙකු වන 01........................................................ ශිල්පියා විසින් අඳින ලද සිතුවමකි. 02. ............................................... නම් වූ මෙම සිතුවම කැන්වසය මත තෙල් සායමින් අඳින ලද්දකි. මෙහි නිරූපිත වර්ණ මාලාව 03. ............................................ ශිල්පක්‍රමය අනුව මැනවින් නිරූපනය කර ඇත. මෙහි නිරූපිත ගිනි සිලුව මෙන්ම ඇගේ මුහුණේ හැඟීම් හා සැසඳෙන ලෙස නිර්මාණය කර ඇති වෙස් මුහුණත්, විශාල හෙවනැල්ලත් සමස්ත නිර්මාණයේ 04.............................................හා නාට්‍යානුසාර බව තීව්‍ර කරවයි. මෙම සිතුවම සඳහා යොදා ඇති වර්ණ 05. ...........................................................ලක්ෂණ ඇති සම්භාව්‍ය වර්ණ මාලාවකි.

- **අංක 06-10 තෙක් දී ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න.**

6. දළදා මාලිගාවේ පත්තිරිප්පුව නිර්මාණය කළ ශිල්පියා කවරෙක් ද?.........................................
7. ඇම්බැක්ක දේවාලයේ වහලයේ දක්නට ඇති විශ්මය දනවන නිර්මාණය කුමන නමකින් හැඳින්වේද? ..........................................................................................................
8. 43 කණ්ඩායමේ චිත්‍ර ප්‍රදර්ශන වලට සහභාගී වූ දෙමළ චිත්‍ර ශිල්පියාගේ නම කුමක්ද?..............................................................................................................
9. තහඩු, කම්බි, ඇණ ආදී විවිධ මාධ්‍ය භාවිත කරමින් එච්. ඒ. කරුණාරත්න ශිල්පියා කළ නිර්මාණයේ නම කුමක්ද? ..........................................................................................
10. ගම්පොළ යුගයේ ඉදිකළ ලංකාතිලක විහාරයේ නිර්මාණ ශිල්පියා කවුරුන් ද?

    ..........................................................................................................................

- **අංක 11-15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයන්ට වඩාත් නිවැරදි පිළිතුර තෝරා , ඊට යටින් ඉරක් අඳින්න.**

11. පොළොන්නරුවේ ගල් විහාරයේ හිටි බුද්ධ ප්‍රතිමාව ප්‍රකාශ කරන මුද්‍රාව වන්නේ,

    i. ධ්‍යාන මුද්‍රාව
    ii. විතර්ක මුද්‍රාව
    iii. පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව
    iv. අභය මුද්‍රාව

12. එකම වර්ණයේ ප්‍රභේද භාවිතයෙන් අඳින ලද චිත්‍ර හඳුන්වන්නේ,

    i. ග්‍රැෆික් චිත්‍ර ලෙසටය
    ii. ස්ක්‍රෙපින් ලෙසටය
    iii. මොනෝක්‍රෝම් චිත්‍ර ලෙසටය
    iv. ටෙම්ප්ලේට් ලෙසටය

13. සින්නක්කුට්ටි නම් වූ කාටූන් චරිතය නිර්මාණය කරන ලද්දේ,

    i. කනකසභාපති ශිල්පියා ය.
    ii. ශිව ඥානසුන්දරම් ශිල්පියා ය.
    iii. ඕබ්‍රි කොලට් ශිල්පියා ය.
    iv. ඒ. මාර්ක් ශිල්පියා ය.

14. ලාංකේය ස්තූපවල හතැරැස් කොටුව වෙනුවට ඉන්දියාවේ සාංචි ස්තූපයේ දක්නට ලැබෙන අංගය වන්නේ,

    i. මේධිය
    ii. යූපය
    iii. හර්මිකාව
    iv. ප්‍රදක්ෂිණා පථය

15. ශිව දෙවියන් කෙරෙහි වූ අසාමාන්‍ය භක්තිය නිසා තම නාරි සුන්දරත්වය අහිමි කරවන ලෙස දෙවියන්ගේ ඉල්ලීම නිසා කෘෂ, අශෝභන තැනැත්තියක් බවට පත්වූ කාන්තා මූර්තිය හඳුන්වන නම වන්නේ,

    i. ශිව පාර්වතී රුව
    ii. කරෙක්කාර් අම්මෙයියාර් මූර්තිය
    iii. සුන්දර මූර්ති ස්වාමි
    iv. නටරාජ රුව

- **අංක 16-20 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වනසේ සම්පූර්ණ වාක්‍යක් බැගින් ලියන්න.**

16. අල්ප උන්නත ..........................................................................................................

17. චූනාර් ..........................................................................................................

18. පංචනාරී ඝටය ..........................................................................................................

19. උඩෙලිපත් ..........................................................................................................

20. ඊ වඩුවා ..........................................................................................................

- **අංක 21-25 තෙක් දී ඇති රූපසටහන් කොටස්වලට සමීප සබඳතාවක් දැක්වෙන රූපසටහන, ඉදිරියෙන් ඇති A,B,C,D,E යන රූප සටහන් අතුරෙන් තෝරා, එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

21.  (.........) A 

22.  (.........) B 

23.  (.........) C 

24.  (.........) D 

25.  (.........) E 

- **අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් වැකිවල හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.**

26. ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන්ම බිහි වූ චෛත්‍යයේ හැඩය ........................................................ ලෙස හැඳින්වේ.
27. මැදවල ටැම්පිට විහාරයේ සිතුවම් ............................................................... යුගයට අයත් වේ.
28. ගුප්ත යුගයේ ඉදි වූ සාරනාත් බුද්ධ ප්‍රතිමාව ................................................. ප්‍රදේශයෙන් හමු වූ නිර්මාණයකි.
29. ඉන්දියාවේ අජන්තා චිත්‍ර ...................................................ට අනුව මුල, මැද, අග සහිතව කතාව නිරූපණය කර ඇත.
30. නෙෆර්ටිටි මූර්තිය ඊජිප්තුවේ ................................................................ යුගය හෙවත් නව රාජධානි යුගයේදී නිර්මාණය වූවකි.

- **අංක 31-35 තෙක් දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, J යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.**



**F**



**G**



**H**



**I**



**J**

31. F අක්ෂරයෙන් දැක්වෙන මූර්තියේ ශිල්පියා කවුරුන්ද? ...........................................................

32. G අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය කුමක්ද? .........................................................................

33. H අක්ෂරයෙන් දැක්වෙන්නේ................................................ යුගයේ නිර්මාණය කළ ලංකාවේ කලාත්මකම සඳකඩ පහනයි.

34. I අක්ෂරයෙන් දැක්වෙන ............................................ විහාරය ඉන්දියාවේ ස්තපතිරායර ශිල්පියා විසින් නිර්මාණය කරන ලද්දකි.

35. J අක්ෂරයෙන් දැක්වෙන ........................................ නැමති සිතුවම මයිකල් ඇන්ජිලෝ ශිල්පියා විසින් කරන ලද සිතුවමකි.

- **ඔබ වෙත සපයා ඇති වර්ණ චිත්‍රය (ඇමුණුම 01) හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ වන පරිදි අංක 36-40 තෙක් දී ඇති උප මාතෘකා වලට අදාළ ව <u>අර්ථවත් වාක්‍ය</u> පහක් ලියන්න. (තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු නොලැබීමට හේතුවක් වනු ඇත.)**

36. තේමාව ..........................................................................................................

37. ස්ථානය ..........................................................................................................

38. මාධ්‍ය ..........................................................................................................

39. ශිල්ප ක්‍රමය ..........................................................................................................

40. කලා ලක්ෂණ ..........................................................................................................

(ඇමුණුම 01)

